

කාර්ය සාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

PERFORMANCE REPORT

2022

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කිලිනොච්චිය

மாவட்டச் செயலகம் - கிளிநொச்சி.

District Secretariat - Kilinochchi.

කාර්යසාධන හා වාර්ෂික
ගිණුම් වාර්තාව - 2023



දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
කිළිනොච්චිය

පටුන

01. ආයතනයේ විස්තර

1.	දිස්ත්‍රික් ලේකම්තුමියගේ පිළිගැනීම	1-2
1.1	කිළිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හඳුන්වාදීම.	3
1.1.1	පරිපාලන මායිම්	3
1.1.2	ඓතිහාසික වැදගත්කම්;	4
1.1.3	ස්වාභාවික සම්පත්	4
1.1.4	වාණිජ හා ආර්ථික කටයුතු;	4
1.2	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දැක්ම මෙහෙවර ක්‍රියාකාරකම්වල අගයන්;	5
1.2.1	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණු;	6
1.3	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කටයුතු;	6-7
1.4	දිස්ත්‍රික්ලේකම් කාර්යාලයේ පිහිටීම සිතියම	8
1.5	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා ග්‍රාම නිළධාරී වසම්	9
1.5.1	ජනගහණ තොරතුරු	9
1.5.2	මූලික තොරතුරු	9

02. වැඩි දියුණු කිරීම හා ඉදිරි දැක්ම්

2.2	ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු	10-11
2.3	පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව	11-12
2.4	කාන්තා ලමා කටයුතු හා සමාජ බලගැන්වීමේ අමාත්‍යාංශය	12
2.5	මුල් ළමාවිය සංවර්ධන අංශයේ කටයුතු	12-13
2.6	කුඩා ව්‍යවසාය සංවර්ධන අංශයේ කටයුතු	14-16
2.7	අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු	17-18
2.8	ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම්	18
2.9	කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම්	19-22
2.10	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	23-25
2.11	සංගණන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුවේ කටයුතු	25-26
2.12	සැලසුම් අංශයේ කටයුතු	26-28

2.13	ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය	28-30
2.14	සමාජ සේවා දෙපාර්තමේන්තුව	31-32
2.15	කෘෂි සංවර්ධන සැලසුම් ක්‍රියාකාරකම්	32-33
2.16	මෝටර් රථවාහන දෙපාර්තමේන්තුවේ කටයුතු	33-34
2.17	දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කටයුතු පිළිබඳ විස්තර	35-36
2.18	සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු	37-38
2.19	ඵලදායිතා ප්‍රවර්ධන ඒකකයේ කටයුතු	38
2.20	විදේශරැකියාදෙපාර්තමේන්තුව	38
2.21	විදාතා අංශය	39

03. දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	40
3.2	මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය	41
3.3	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	42
3.4	මූල්‍ය ප්‍රකාශ සටහන්	43-73
3.5	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	74
3.6	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය	75
3.7	මු.රෙ. 208 ප්‍රකාරව,වැය සඳහා වන ප්‍රතිපාදන	75-83
3.8	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	84
3.9	විගණකාධිපතිවරයාගේ වාර්තාව	85-103

04. කාර්යසාධන කේතය

4.1	ආයතනයේ කාර්ය සාධන දර්ශක	104

05. තිරසාර සංවර්ධන ඉලක්ක

5.1	හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන ඉලක්ක	105
5.2	සංවර්ධන ඉලක්කවල ප්‍රගතිය හා අභියෝග	106-108

06. මානව සම්පත් පැතිකඩ

6.1	සේවක සංඛ්‍යා කළමනාකරණ	109
6.2	මානව සම්පත් හිඟය	109
6.3	මානව සම්පත් සංවර්ධනය	110

07. අනුකූලතා වාර්තා

1. පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ. **111-118**
2. පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)
3. මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කරන ලදී. (මු.රෙ. 135)
4. වාර්ෂික සැළැස්ම සකස් කිරීම
5. නියමිත දිනට පෙර ඉදිරිපත් කරන ලදී
6. අභ්‍යන්තර විගණනය
7. විගණන හා කළමනාකරණ කමිටු
8. දේපළ කළමනාකරණය
9. වාහන කළමනාකරණය
10. බැංකු ගිණුම් කළමනාකරණය
11. මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය
12. රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්
13. පොදු තැන්පත් ගිණුම
14. අග්‍රිම ගිණුම
15. ආදායම් ගිණුම.
16. මානව සම්පත් කළමනාකරණය
17. මහජනයා වෙත තොරතුරු ලබාදීම
18. පුරවැසි ප්‍රඥප්තිය ඉදිරිපත් කිරීම
19. මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.
20. විගණන ඡේද සඳහා වන වගකීම්

දිස්ත්‍රික් ලේකම්තුමියගේ පිළිගැනීම



කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ **2022** වන වර්ෂය සඳහා වන වාර්ෂික කාර්යක්ෂමතා වාර්තාව හා ගිණුම් වාර්තාව ඉදිරිපත් කරන්නෙමි. මෙම වාර්තාව වනාහි රජය විසින් ක්‍රියාත්මන කරන ලද වැඩ සටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් **2022** වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන, අක්මුදල් ආදිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කෙලෙස සක සුරුවම් සහිතව හා කාර්යක්ෂමතාවයෙන් යුතුව උපයෝගි කරනු ලබන්නේ යන්න පැහැදිලිව හුවා දක්වයි.

උතුරු පළාතේ මධ්‍යම පෙදෙසේ පිහිටි කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චි,කන්ඩාවලෙයි,පූනකරි,පච්චිලෛප්පල්ලි යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සතරක් අයත්වේ. මෙම දිස්ත්‍රික්කයේ ජනතාවන්ගේ ප්‍රධාන ජීවනෝපාය ලෙස ගොවිතැන හොබවන අතර ධීවර රැකියාව තල් හා පොල් ආශ්‍රිත භාන්ඩ නිෂ්පාදනය හා නොයෙක් ස්වයං රැකියාවෙහිද නිරතව සිටිති.

2022 වර්ෂයේ විමධ්‍යගත අය වැය හා ගම සමඟ සංවර්ධන ව්‍යාපෘති මඟින් නොයෙක් වැඩ සටහන් දිස්ත්‍රික්කයේ විශිෂ්ය ලෙස ක්‍රියාත්මක කර තිබේ. මෙය පමණක් නොව ග්‍රාම සංවර්ධන, ආපදා කළමනාකරණ, සමාජ සේවා හා ලමා හා කාන්තා අංශය විසින් මහජනතාවන්ගේ යහපත පතා නොයෙක් කටයුතු ක්‍රියාත්මක කර තිබීම කැපී පෙනෙන දෙයක්වේ.
විද්‍යුත්කරණය කරන ලද කාර්යාල ක්‍රියාකාරකම් මඟින් ජනතාවන්ට සේවාවන් ලබා දෙනු ලබන අතර මෙය ආශ්‍රිතව නොයෙක් පුහුණු නිලධාරීන් හට දිගටම ලබාදීම කැපී පෙනෙන දෙයක්වේ.

තවද ජාතික ඵලදායිතා තරඟයේ දෙවතාවක්ම ප්‍රථම ස්ථානය දිනාගත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කිලිනොච්චිය ඊළඟ රන් පදක්කම දිනාගන්නා අයුරෙන් ඵලදායිතා ක්‍රියාවන් නිසි පරිදි සිදු කර ගෙන යයි. තවද දිස්ත්‍රික් ආපදා කළමනාකරණ අංශය විසින් විවිධ නිළධාරීන් සඳහා ආපදා කළමනාකරණ වැඩමුළු හා ඊසානදිග මෝසම් වැසි හා මොන්ටස් කුණාටුවේ ප්‍රතිචාර ක්‍රියාකාරකම්ද සිදුකරන ලදී. ලමුන්,

කාන්තාවන්, වැඩිහිටියන් වැනි නොයෙක් පාර්ශවයන්ට අදාළ සහනාධාර වැඩ සටහන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල මූල්‍ය අනුග්‍රහයෙන් සිදු කිරීම කැපී පෙනෙන දෙයක්වේ.

2022 වන වසරේ දිවයිනේ ඇති වූ ඉන්ධන අර්බුදය සැළකිල්ලට ගෙන කෘෂිකර්මය, ගමනා ගමනය හා වෙනත් අවශ්‍යතාවයන්ට අවශ්‍ය වන ඉන්ධන විධිමත් පරිදි බෙදාහැරීමේ කටයුතු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සතර හරහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදු කරන ලදී. ඒ සමඟ ආහාර සුරක්ෂිතභාවය හා ගෙවතු වගාව පිළිබඳ නොයෙක් ක්‍රියාකාරකම් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල දායකත්වයෙන් සිදු කර දිස්ත්‍රික්කයේ ජනතාවන්ගේ ආහාර අවශ්‍යතාවයන් යම්කිසි තරමකට හෝ පිරිමසා ගැනීමේ ක්‍රමෝපායන් සිදුකරන ලදී.

කිලිනොච්චි දිස්ත්‍රික් ජනතාවන්ගේ ජීවනෝපාය හා සංවර්ධන කටයුතු ආදිය ප්‍රමිතියෙන් යුතුව හා කාර්යක්ෂමතාවයෙන් යුතුව ඉටු කරනු ලබන අතර අපගේ දිස්ත්‍රික්කය තිරසාර සංවර්ධනය ලභා කර ගැනීම අපගේ අරමුණවේ.

රූ. කේතීස්වරන්,

දිසාපති / දිස්ත්‍රික් ලේකම්,

දිස්ත්‍රික් ලේකම් කායර්ාලය,

කිලිනොච්චි.

ආර්.කේදිස්වරන්
දිසාපති / දිස්ත්‍රික් ලේකම්
කිලිනොච්චි දිස්ත්‍රික්කය

01. වැඩි දියුණු කිරීම හා ඉදිරි දැක්ම

1.1 කිළිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හඳුන්වා දීම.

1.1.1 පරිපාලන මායිම්

උතුරුපළාතේ මධ්‍යම ප්‍රදේශයේ පිහිටා ඇති කිළිනොච්චි දිස්ත්‍රික්කය උතුර යාපනය දිස්ත්‍රික්කය සීමාව ලෙසද නැඟෙනහිර හා දකුණු දිසාව මුලතිව් දිස්ත්‍රික්කය සීමාව ලෙසද බස්නාහිර දිසාව හා දකුණු දිසාව මන්නාරම් දිස්ත්‍රික්කයද මායිම් වශයෙන් ද පිහිටා ඇත



1.1.2 ෛඑතිහාසික වැදගත්කම්

ශ්‍රී ලංකාවේ පළමුවන මානව ජනාවාසයේ ආරම්භන සළකුණ ලෙස ඉරණමඩු ප්‍රදේශය හඳුනා ගැනීම මඟින් කිළිනොච්චි දිස්ත්‍රික්කයේ පෞරාණිකත්වය පටන් ගනු ලැබෙයි. යාපනය දිස්ත්‍රික්කය සමඟ එක්ව දක්නට තිබූ කිලිනොච්චි ප්‍රදේශය නව දිස්ත්‍රික්කයක් ලෙස **1984** වර්ෂයේ පිහිටුවනු ලැබුවේය.එම කාල වකවානුවේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ වාසය කළ ජනතාවන් කෘෂිකර්මය,දඩයම් කිරීම,ධීවර කටයුතු සහ සත්ව පාලනයද සිදු කර ගෙන ගිය අතර ඒය ගබඩා කර තැබීමේ පළ පුරුද්දද ඇති අයවලුන්වූහ.

මෙම දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ඉරණමඩු වැව ඇතුළු මහා වාරිමාර්ග වැව් 04 ක්ද මධ්‍යම වාරිමාර්ග ගණයට අයත් වැව් 05 ක්ද කුඩා වාරිමාර්ග වැව් 394 ක්ද මෙම දිස්ත්‍රික්කයේ පිහිටා තිබීම මඟින් ජනතාවන්ගේ ජීවනෝපාය ක්‍රමයන් පිළිබිඹු කරයි. තවද තාක්ෂණය හා කලාත්මකභාවයෙන් යුතු ජන සමූහයක් මෙම ප්‍රදේශයේ විසූ බව විශ්වාස කරනු ලැබේ.

මෙම දිස්ත්‍රික්කයේ ෛඑතිහාසික වැදගත්කමකින් යුතු උරුත්තිරපුරම් සිවන් කෝවිල, පුකියම්පොක්කනෙ නාගතම්බිරාන් කෝවිල, මන්නිත්තලෙ ශුද්ධ වූ අන්තෝනි මුනිඳුන් කිතුණු දේවස්ථානය, පාලෙත්තීවු ශුද්ධ වූ අන්තෝනි මුනිඳුන් කිතුණු දේවස්ථානය හා පොන්නාවෙලි සිවන් කෝවිල ආදිය සමඟ පූනකරි ඕලන්ද බලකොටුව ආදියද දක්නට තිබේ.

1.1.3 ස්වාභාවික සම්පත්

ස්වාභාවික සම්පත් ලෙස ඉරණමඩු වැව, චුණ්ඩික්කුලම කුරුළු අභය භූමිය, වන්නේරික්කුලම් කුරුළු අභය භූමිය හා ගෞදාරිමුනෙ මුහුදු වෙරළද දැකිය හැකියි.

1.1.4 වාණිජ හා ආර්ථික කටයුතු

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ජීවත් වන ජනතාවන්ගෙන් බහුතරයක්ම වී ගොවිතැන සමඟ ධාන්‍ය වගා කිරීමේ කටයුතුවල හා සත්ව පාලනය, පළතුරු වගාව සහ ධීවර රැකියාවෙහිද නිරතව සිටිති.

1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දැක්ම මෙහෙවර ක්‍රියාකාරකම්වල අගයන්

දැක්ම

නවීකරණය කරන ලද දිස්ත්‍රික් පරිපාලනය මඟින් ඵලදායිතාවයෙන් යුතු මහජන සේවයක් ලබාදීම

අරමුණු

රජයේ ප්‍රතිපත්ති අනුව කාර්යක්ෂමතාවය උපයෝගී කර ගනිමින් විශිෂ්ය සම්බන්ධීකරණයක් මඟින් දිස්ත්‍රික්කයේ සංවර්ධන හා සමාජ සංස්කෘතික සාරධර්ම ඉහළ නැංවීම

මෙහෙවර

මෙහෙවර

1. අපක්ෂපාති අවංක ඵළදායිතාවයෙන් යුතු සේවාවක් ලබාදීම
2. එකම තනතුරු තත්වයක සිටින සියළු සේවකයන් සමව ගරු කරනු ලබන අතර සේවකයන්ගේ , සුභසාධනය හා සබැඳි කරුණුවලට ප්‍රමුඛත්වය ලබාදීම.
3. පරිසරයට හිතකර ප්‍රවේශයන් උපයෝගි කිරීම
4. ආබාධිත වැඩිහිටි අයවලුන්හට නිහතමානි , මසේවාවක් ලබාදී
5. කාර්යාලයේ අනුගමනය කළ යුතු න්‍යායන් හා සිරිත් විරිත් සියළුම සේවකයන් පිළිගැනීම හා අනුගමනය කිරීම
6. විද්‍යුත් ක්‍රම මඟින් ජනතාවට පහසු සේවාවක් ලබාදීම

1.2.1 දිස්ත්‍රික්ලේකම් කාර්යාලයේ අරමුණු

- දත්ත විද්‍යුත්කරණය කිරීම මගින් පහසු මහජන සේවාවක් ක්‍රියාත්මක කිරීම
- කාර්යක්ෂමතාවයෙන් යුතු සම්පත් උපයෝගිතාවය
- සේවාලාභීන් හා සම්පත්වල ඵලදායිතාවය ඉහළ මට්ටමකට ගෙන යාම
- පරිසර හිතකාමී නිෂ්පාදන භාණ්ඩ භාවිතා කිරීම
- එජනතාවන්ට පහසු හා කාර්යක්ෂමතාවයෙන් යුතු සේවාවක් ලබාදිය හැකි අයුරෙන් කාර්යාලය සිත් ආකර්ශනය වන අයුරෙන් හා රඳා පැවතීමේ තත්වයට ගෙන ඒම
- ජනතාවන්ගේ ජීවන තත්වය ජාතික ජීවනතත්වයට සමානව ඉහළ නැංවීම
- සමෘද්ධි යටිතල ඉදිකිරීම් ප්‍රවර්ධනය, රැකියා අවස්ථාවන් වැනි ක්‍රියා සැළසුම් හරහා දිළිඳුකම හැකි තරම් අඩු කිරීම
- ජීවනෝපාය ආධාර මඟින් පූර්ණ ආදායම් මට්ටම තහවුරු කිරීම
- ආයතනය සඳහා වන විකල්ප කළමනාකරණයක් ගොඩනැංවීම
- ආයතනයේ තිරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීම.
- තිරසාර සංවර්ධන මට්ටම අඛණ්ඩව වැඩිදියුණු කිරීම

1.3 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කටයුතු

කාර්යක්ෂමතාවයෙන් යුතු දිස්ත්‍රික් පරිපාලන ක්‍රමය

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර පරිගණක ජාල සම්බන්ධ කිරීම අභ්‍යන්තර පරිගණක ජාල ක්‍රමයන් හා බාහිර ජාලයන්ද පිහිටුවීම.
- නිළධාරීන් සම්බන්ධව වන පුද්ගලික ලිපි ගොනු පවත්වා ගෙන යාම,වැටුප් හා වෙනත් දීමනා,දුම්රිය ගමන් බලපත්‍ර ලබා දීම හා නිළධාරීන්ගේ නිළයන්ට අවශ්‍ය වන අයුරෙන් පුහුණු ලබාදීම.
- විශ්‍රාමික නිළධාරීන් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීමට ඇවැසි කටයුතු සිදුකිරීම.

පිවිතුරු පොදු සේවාවන් ග්‍රාම,ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ජනතාවන්ට ලබා දීම හා ලබා ගැනීම තහවුරු කර ගැනීම

- ජාතික හැඳුණුම් පත්,මෝටර් රථ වාහන බදු,ව්‍යාපාර ලියාපදිංචිය ආදිය ලබාදීම.
- උප්පැන්න,විවාහ හා මරණ ලියාපදිංචි ප්‍රමාදයෙන් තොරව සිදුකිරීම හා ඒවායේ පිටපත් ලබාදීම
- රියදුරු බළපත්‍ර ලබාදීම
- ඉඩම් බළපත්‍ර ලබාදීම සඳහා කටයුතු සළසාදීම හා ඉඩම් ගැටළු විසඳීම
- සංස්කෘතික සිරිත් විරිත් හා ශාරීරික හා මානසික යහ පැවත්ම
- කලා හා සංස්කෘතික උත්සව පැවත්වීම හා කලාව හා සංස්කෘතිය හා සබැදි තරඟ පැවත්වීම
- සංස්කෘතිය හා සබැඳි ක්‍රීඩා උත්සව පැවත්වීම.
- දිස්ත්‍රික් ක්‍රීඩා උත්සව හා ආබාධිත අයවලුන් සඳහා වන ක්‍රීඩා උත්සව පැවත්වීම
- යහපත් පුරවැසියන් බිහිකිරීමට හැකිවනසේ ළමුන්ට හා තරුණයින්හට දැනුවත් කිරීමේ වැඩමුළු පැවත්වීම සහ උපදේශන ප්‍රවර්ධන වැඩ සටහන් පැවත්වීම.

ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමේ සිටින ජනතාවන්ගේ අධ්‍යාපන, සෞඛ්‍ය හා කෘෂිකර්ම කටයුතු ආදියට උපකාර කරන අතර දිළිඳු මට්ටම තුළ සිටින අයවලුන්ට සහනාධාර හා ජීවනාධාර උපකාර ලබාදීම.

- කාන්තා මූලිකත්වය දරණ පවුල්වලට ස්වයං රැකියා පුහුණු ලබාදීම හා දිරි දීමනා ලබාදීම.
- වැඩිහිටියන්ට හා ආබාධිත අයවලුන්හට සහ විශේෂිත රෝගී තත්වයේ පසුවන අයවලුන්හට දීමනා ලබාදීම
- ආපදා කළමනාකරණ සේවා ඒකකය විසින් ග්‍රාමීය මට්ටමේ හදිසි ආපදා හා සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩමුළු පැවත්වීම හා ඒම අවස්ථාවේම ආපදා සහන සේවාවන් ක්‍රියාත්මක කිරීම
- ඡන්ද නාම ලැයිස්තු ලියාපදිංචි කටයුතු සිදු කිරීම හා මැතිවරණ සම්බන්ධීකරණය
- ගොවියන්ට අවශ්‍ය බීජ, යෙදුම් ද්‍රව්‍ය හා කෘෂි උපකරණ ලබා දීම

මාර්ග සංවර්ධන, වාරිමාර්ග, විදුලි පහසුකම් සළසා දීම හා නිවාස යෝජනා ව්‍යාපෘති කටයුතු සැකසීම හා යුද්ධයෙන් පීඩාවට පත්වූ අයවලුන්හට වන්දි මුදල් ලබාදීම හා දිස්ත්‍රික්කයේ සියළුම සංවර්ධන කටයුතු සංවිධානය කර නියාමනය කිරීම

1.4 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිහිටීම දක්වන සිතියම

மாவட்டச் செயலகம், கிளிநொச்சி
நிறுவன கட்டமைப்பு

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කිලිනොච්චිය
District Secretariat, Kilinochchi
සංවිධාන වියුහය
Organization Chart



1.5 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හා ග්‍රාම නිළධාරී වසම්

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ	ග්‍රාම නිළධාරී වසම්
කරච්චි	42
කණ්ඩාවලෛ	16
පූනකරි	19
පච්චිලෛප්පල්ලි	18

1.5.1 ජනගහණ තොරතුරු

අංක	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ	පවුල් සංඛ්‍යාව	සම්පූර්ණ පුද්ගලයින් සංඛ්‍යාව	පිරිමි	ගැහැණු	දෙමළ	සිංහල	මුස්ලිම්
01	කරච්චි	26,910	78,470	37,923	40,547	77,516	93	861
02	කණ්ඩාවලෛ	9,265	27,377	13,300	14,077	27,350	2	25
03	පූනකරි	8,448	27,799	13,899	13,900	26,088	8	1703
04	පච්චිලෛප්පල්ලි	4,804	14,802	7,280	7,522	14,751	24	27
එකතුව		**49,427**	**148,448**	**72,402**	**76,046**	**145,705**	127	**2,616**

1.5.2 මූලික තොරතුරු

දිස්ත්‍රික්කය	කිලිනොච්චිය
පළාත	උතුර
මුළු භූමි ප්‍රමාණය	**1279 sqkm**
ග්‍රාම නිළධාරී වසම් සංඛ්‍යාව	**95**
ගම්මාන සංඛ්‍යාව	**354**
ජන්ද කොට්ඨාශ සංඛ්‍යාව	**95**
ප්‍රාදේශීය සභා සංඛ්‍යාව	**03**
කළාප අධ්‍යාපන අධ්‍යාපන කාර්යාල	**02**
පාසල් සංඛ්‍යාව	**104**
අධ්‍යාපනය හැදෑරන සිසුන් සංඛ්‍යාව	**29118**
ගුරුවරුන් සංඛ්‍යාව	**2119**
ජනගහණය	**148452**

2.1 විශේෂජයග්‍රහන අභියෝගහාඉදිරිඉ ලක්ක

2.2 ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු

උතුරු පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන කිලිනොච්චි දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු ලෙස පහත දක්වා ඇති දෑ සඳහන් කළ හැකියි.

• කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සතරක ග්‍රාම සංවර්ධන සමිති 175 ක් ලියාපදිංචි කර ක්‍රියාත්මක වෙමින් පවතියි. මෙම සියළුම සමිතීන් ග්‍රාමීය මට්ටමේ විශිෂ්ඨ ලෙස ක්‍රියාත්මක වන සමාජ මට්ටමේ සංවිධාන වේ.

• කිලිනොච්චි දිස්ත්‍රික්කයේ රැකියා විරහිතව සිටින ග්‍රාමීය තරුණියන් ස්වයං රැකියාවන්හි දිරි ගැන්වීම සඳහා හා පැසැල් අධ්‍යාපනය අතර මහදී හැර ගොස් රැකියා අවස්ථාවන් සොයා ගැනීමට නොහැකිව සිටින කාන්තාවන්ට උපකාර වන අරමුණෙන් කාන්තා සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවා කාන්තා සංවර්ධන මධ්‍යස්ථානයේ උපදේශක හරහා ග්‍රාමයන්හි කාන්තාවන් හා සබැඳි නොයෙක් වර්ගයේ ඇඳුම් නිර්මාණය, අත්කම්, ගෘහ ආර්ථිකය, සෞන්දර්ය පුහුණු ලබා දෙනු ලැබේ. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චි, කණ්ඩාවලෙ, පූනකරි, පච්චිලෙප්පල්ලි ආදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ක්‍රියාත්මක වන කාන්තා සංවර්ධන මධ්‍යස්ථානවල සිසුන් 20 දෙනෙක් බැගින් සිසුන් 80 දෙනෙක් පුහුණුව ලබා පිටත් වී ඇත. මෙම අයවලුන්හට මාස 12 න් යුතු ගෘහ ආර්ථික ඩිප්ලෝමා පාඨමාලාව යන මැයෙන් පුහුණුව ලබා දෙනු ලැබුවේය. සෑම සිසුවෙකුටම දිනකට දිරි දීමනාව ලෙස රුපියල් 200.00 ක මුදලක් ලබාදෙනු ලැබුවේය. පුහුණුව අවසානයේ සියළුම ප්‍රාදේශිය කොට්ඨාශවල විභාග පවත්වා, අවසානයේ ප්‍රාදේශීය හා පළාත් මට්ටමෙන් ප්‍රදර්ශනයක්ද පවත්වනු ලැබුවේය. (Four WDC regiterd under the TVEC and got NVQ level IV certificates)

- උතුරු පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවි ක්‍රම මඟින් අවශ්‍ය කරුණු ලබා ගැනීමේ පහසුකම් සිදු කර ක්‍රියාත්මක කර ඇත.
    * ප්‍රාදේශිය වශයෙන් වන යාවත්කාලීන කිරීම් සම්බන්ධවීම සඳහා වන විස්තර
    * ලියාපදිංචි සමිති
    * ලියාපදිංචි සමිතිවල පරිපාලන විස්තර
    * ලියාපදිංචි සමිතිවල දේපළ විස්තර.
    * සමිතිවල හා සමිති සාමාජිකයින්ගේ ස්ථරම් නිෂ්පාදන පිළිබඳ තොරතුරුවල විස්තර.
    * දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කර ඇති ග්‍රාමීය කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිවල අංකය සමඟ විස්තර ලියාපදිංචි අංකය.

* යාවත්කාලීන කළ හැකි පහසුකම්.
* ව්‍යවස්ථා රීති
* පුහුණු අයැදුම්.
* දෙපාර්තමේන්තු චක්‍රලේඛ.

ආදිය ඇතුළත් කර මහජන නැරඹුමට තැබීම සඳහා නිර්මාණය කර විශිෂ්ඨ ලෙස ක්‍රියාත්මකවේ.

ප්‍රාමණිය පදනම මත වූ ප්‍රාග්ධන පරිත්‍යාග යටතේ සිදු කර ගෙන යනවැඩසටහන්

වැඩ සටහන්	ප්‍රතිපාදන	වියදම
සම්බුක්කුලම් ග්‍රාම සංවර්ධන සමිති ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය	**300,000**	**300,000**
මුගාවිල්ග්‍රාම සංවර්ධන සමිති ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය	**324,515.17**	**324,515.17**
එකතුව	**624,515.17**	**624,515.17**

2.3 පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

මෙම දෙපාර්තමේන්තුව වනාහි කාන්තා, ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයන්හි ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධන නිළධාරීන් පත් කර ඇත. මෙම පත්වීම මඟින් සියළුම ළමුන්හට සම අවස්ථාවන් ලබාදීම විශේෂයෙන් අනාථ,අසරණ හා නීතිය හා සමඟ විෂමතා ඇති කර ගත් ළමුන් සඳහා වන ආරක්ෂණ හා නඩත්තු කිරීම ලබාදීමයි. ඒ අනුව 2021 වර්ෂයේ සිදුකරන ලද වැඩසටහන් පහත දැක්වේ.

අංක	වැඩ සටහන්	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	වැය විස්තර
01	දිස්ත්‍රික් ප්‍රවර්ධන ප්‍රගති සමාලෝචනය	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	11,500
02	දිස්ත්‍රික් ළමා සභාවේ සාකච්ඡාව	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	10,060
03	පැසසිය යුතු ළමයෙකු සේ වෙනස්වීමට හැකියා වර්ධන සාකච්ඡාව	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	20,000
04	ළමා සමාජ හා ළමා සභාවේ සාකච්ඡාවන්	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	24,000
05	ප්‍රාදේශීය ළමා සංවර්ධන කමිටු සාකච්ඡාවන්	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	32,000
06	ප්‍රාදේශීය ලේකම් කාර්යාල ළමා දින උත්සවය	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	12,000
07	නඩත්තු වැඩ සටහන	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	213,393
08	දිස්ත්‍රික් ලේකම් කාර්යාල ළමා දින උත්සවය	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	3,105
09	පාසල අතහැර ගිය අවිධිමත් සිසුන් සඳහා වන අධ්‍යාපන ආධාර	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	24,000

10	නිවුන් දරුවන් සඳහා වන ආධාර	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	22,500
11	සෞඛ්‍ය ආධාර	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	10,000
12	පෝෂ්‍යදායී ආහාර දීමනා	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	5,000
13	වෙබ් අඩවි ආරක්ෂක දැනුවත් කිරීම්	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	11,880
14	දැඩි තර්ජනයන්ට ලක්වූ ලමුන් සඳහා වන ආධාර	ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	90,000
එකතුව			**489,438**

2.4 කාන්තා ලමා කටයුතු හා සමාජ බලගැන්වීමේ අමාත්‍යාංශය

අංක	වැඩ සටහන	වැඩ සටහන් විස්තර	වියදම
01	ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක්වූ පුද්ගලයින් සඳහා වන හදිසි ආධාර වැඩ සටහන්	ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක්වූ පුද්ගලයින්ට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මට්ටමේ හඳුනා ගත් අයවලුන්ට නිකුත්කිරීම	25,000
02	ජාත්‍යන්තර ලමා දිනය	විෂිශ්ඨතම කාන්තා ව්‍යවසායකයින් තෝරා ගැනීම ජාත්‍යන්තර ලමා දිනය නිමිත්තෙන් දිස්ත්‍රික් වශයෙන් තෝරා ගන්නා ලද කාන්තා ව්‍යවසායකයින් 5 දෙනාගේ වාණිජ මධ්‍යස්ථාන අධීක්ෂණය කිරීමට ගිය මාණ්ඩලික නිළධාරීන් සඳහා වන ලිපි ද්‍රව්‍ය හා උපස්ථාන වියදම් සිදු කරන ලදී.	5,000
03	දිස්ත්‍රික් ප්‍රගති සාකච්ඡාව	කාන්තා සංවර්ධන හා ආරක්ෂාව සම්බන්ධව මාසික හා වර්ෂාවසානක්‍රියාකාරී සැලස්මෙහි ප්‍රගති සමාලෝචනය කාන්තා සංවර්ධන නිළධාරි, උපදේශනසහකාර සමඟ පවත්වන ලදී.	4,000
එකතුව			34,000

2.5 මුල්ළමාවියසංවර්ධනඅංශයේකටයුතු

මුල් ළමා විය යන්න ගර්භයේ ප්‍රසව වූ දරුවාගේ කාළයේ සිට අවුරුදු 05 දක්වා වූ කාලය වේ.

මුල් ළමා විය සංවර්ධනය යන්න ළමුන්ගේ භෞතික තත්වය, මානසික වර්ධන තත්වය, සමාජ ප්‍රවර්ධනය හා දැනුම වර්ධනය වීම ආදිය ඒකරාශී කරන ලද පූර්ණ ක්‍රියා පටිපාටිය තහවුරු කිරීමවේ.

මෙහි අරමුණ ළමුන්ගේ ශාරීරික මානසික වර්ධන හා පැහැදිලි මානසිකත්වයෙන් යහපත් සිරිත් විරිත් වලින් පාසල් යා හැකි තත්වයට ඔවුන්ව සූදානම් කිරීම වේ.

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ලමා කටයුතු කාර්යාලය විසින් දිවයින පුරා සිටින ලමුන් සැළකිල්ලට ගෙන පහත වැඩ කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ.

ප්‍රධාන වැඩ කටයුතු

- පෙර පාසල් ලමුන්ට පෝෂ්‍යදායි උදේ ආහාරය ලබාදීම.
- ගැබිණි මව්වරුන් සඳහා රු -/20,000 .ක් වටිනා පෝෂ්‍යදායි ආහාර මලුවක්) මාස 10 ට (ලබාදීම .
- පිරිමි හා ගැහැණු ලමුන්ට එරෙහි අපයෝජන හා හිංසනවලින් පෙර ආරක්ෂාව සැපයීම.
- වැටුප් නොලබන පෙර පාසල් ගුරුවරුන් සඳහා මාසිකව රුපියල් -/250 ක උපකාර මුදලක් ලබාදීම.
- ජාතික ලමා දිනය හා ලමුන්හට සෙනෙහස පරිසරයක් උපදවන වැඩ සටහන්
- ක්‍රියාත්මක කරනු ලබන මුල් ලමාවිය ආරක්ෂාව හා සංවර්ධන වැඩ සටහන් පෙර පාසල් විශේෂත්වයෙන් යුතුව ඉදිකිරීම) ලෝක බැංකුවේ 5 වසරක සැළසුම (

අනු අං.	ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන්	භෞතික ප්‍රගතිය	ප්‍රතිපාදන	වියදම	ශේෂය
1	ගැබිණි මව්වරුන් සඳහා රු . ක් වටිනා -/20,000 දායි ආහාර මලුවක්පෝෂ්‍ය ලබාදීම.	100	31,008,000	29,560,000	14,480,00
2	පෙර පාසල් ලමුන්ට පෝෂ්‍යදායි උදේ ආහාරය ලබාදීම.	100	31,77,850	31,77,850	00
3	වැටුප් නොලබන පෙර පාසල් ගුරුවරුන් සඳහා මාසිකව රුපියල් -/250ක උපකාර මුදලක් ලබාදීම.	100	900,000	865,000	35,000
4	ළමුන් සඳහා ඉගෙනීමේ මෙවලම් ලබාදීම	100	84,000	84,000	00
එකතුව		100	35,169,850	33,686,850	1,483,000

2.6 කුඩා ව්‍යවසාය සංවර්ධන අංශයේ කටයුතු

තරුණ තරුණියන්ගේ ව්‍යවසාය හැකියාවන් හා ඵලදායිතා තත්වයන් වර්ධනය කිරීම මඟින් රැකියා බිහිකිරීම් වැඩි කර ආදායම් මට්ටම ඉහළ නංවා රටේ ආර්ථික ක්ෂේත්‍රයේ ව්‍යවසායන්යින්ගේ උච්චතම අවස්ථාව ලබා ගැනීමේ අරමුණෙන් කුඩා ව්‍යවසාය සංවර්ධන අංශය නොයෙක් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරමින් සිටියි. ඒ අනුව ව්‍යවසාය අවස්ථාවන් හඳුනා ගැනීම, ව්‍යාපාරික ගැටළු නිරාකරණය කිරීම, වෙළඳ පොළ අවස්ථාවන් හඳුනා ගැනීම, තාක්ෂණික පුහුණුව ලබාදීම හා ව්‍යාපාර වර්ධනය කිරීම පිළිබඳව ව්‍යවසායකයින්ගේ සුභසාධන හා සබැඳි නොයෙක් ව්‍යාපෘතීන් කුඩා ව්‍යවසාය සංවර්ධන අංශය විසින් ක්‍රියාත්මක කරමින් පවතියි.

පුහුණු පාඨමාලා පිළිබඳ විස්තර - 2021

අංක	පුහුණු පාඨමාලා පිළිබඳ විස්තර	දිස්ත්‍රික් / ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	වියදම
01	නිළධාරි සාකච්ඡාව	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය්	13	2,700
02	වාණිජ බැංකු සඳහා පිටපත් ගැනීම	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය්	13	5,500
03	නිළධාරි සාකච්ඡාව	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය්	13	2,200
04	ව්‍යවසායකත්ව දැනුවත් කිරීම සහ ආකල්පය	පච්චිලෛප්පල්ලි	20	2,450
05	ව්‍යවසායකත්වදැනුවත් කිරීම සහ ආකල්පය	කන්ඩාවලෙයි	20	2,410
06	කාර්මික පුහුණුව - කේක අයිසිං සකස් කිරීම	කන්ඩාවලෙයි	20	12,120
07	ව්‍යවසායකත්ව දැනුවත් කිරීම සහ ආකල්පය	කරච්චි	20	5,200
08	තරුණ ව්‍යවසායකත්ව දිරි ගැන්වීම	කරච්චි	20	6,200
09	අළුත් වෙළඳ අවස්ථාවන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම	කරච්චි	20	7,900
10	තරුණ ව්‍යවසායකත්ව දිරිගැන්වීම	කන්ඩාවලෙයි	20	3,660
11	තරුණ ව්‍යවසායකත්ව දිරිගැන්වීම	පච්චිලෛප්පල්ලි	20	3,700
12	ව්‍යවසායකත්ව දැනුවත් කිරීම සහ ආකල්පය	පූනකරි	20	2,700
13	නිළධාරී සාකච්ඡා	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය්	13	2,950
14	ව්‍යවසායකත්වයන් සඳහා වන වාණිජ හා බැංකු ජංගම සේවාව	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය්	120	50,720
15	තරුණ ව්‍යවසායකත්ව දිරිගැන්වීම	පූනකරි	20	3,700
16	කාර්මික පුහුණුව- ගව පාලනය හා ජීවනාධාර	කරච්චි	20	10,200
17	කාර්මික පුහුණුව - කේක් අයිසිං සකස් කිරීම	පච්චිලෛප්පල්ලි	20	9,460
18	කාර්මික පුහුණුව- මීමැසි පාලනය	කන්ඩාවලෙයි	20	10,160

19	කාර්මික පුහුණුව- කේක් අයිසිං සකස් කිරීම	පූනකරි	20	9,940
20	අළෙවි ව්‍යාප්තිය	කරච්චි	10	9,800
21	මිළ ඇස්තමේන්තුව	කන්ඩාවලෙයි	20	6,649
22	මිළ ඇස්තමේන්තුව	පූනකරි	20	4,700
23	මිළ ඇස්තමේන්තුව	කරච්චි	20	7,200
24	මිළ ඇස්තමේන්තුව	කරච්චි	20	7,200
25	මිළ ඇස්තමේන්තුව	කන්ඩාවලෙයි	20	6,649
26	මිළ ඇස්තමේන්තුව	පූනකරි	20	4,700
27	නිළධාරී පුහුණුව(MIS SEDD)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය්	15	9,700
28	නව ව්‍යාපාර අවස්ථාවන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම	කන්ඩාවලෙයි	20	4,649
29	ප්‍රාදේශීය මට්ටමේ ප්‍රදර්ශනය	පූනකරි	30	25,700
30	ප්‍රාදේශීය මට්ටමේ ප්‍රදර්ශනය	කන්ඩාවලෙයි	30	23,600
31	ප්‍රාදේශීය මට්ටමේ ප්‍රදර්ශනය	පච්චිලෙප්පල්ලි	32	20,000
32	දිස්ත්‍රික් මට්ටමේ ප්‍රදර්ශනය	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය්	40	21,600
33	නිළධාරී සාකච්ඡා	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය්	13	2,250
34	දිස්ත්‍රික් මට්ටමේ ප්‍රදර්ශනය	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය්	40	21,800
35	පිරිවැය ගිණුම්කරණය	කන්ඩාවලෙයි	20	6,200
36	මිළ ඇස්තමේන්තුව	කන්ඩාවලෙයි	20	6,200
37	නව ව්‍යාපාර අවස්ථාවන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම	කරච්චි	20	5,200
38	ව්‍යවසාය සම්මේලනය ඉදිකිරීම - රූපලාවන්‍ය ශිල්පීන්	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය්	40	9700
39	කාර්මික පුහුණුව- ආරි වර්ක්	පච්චිලෙප්පල්ලි	20	9,520
40	කාර්මික පුහුණුව- ආරි වර්ක්	කරච්චි	20	8,000
41	කාර්මික පුහුණුව- ආරි වර්ක්	පූනකරි	20	10,100
42	නිළධාරී සාකච්ඡා	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය්	15	2,450
43	කාර්මික පුහුණුව- කොණ්ඩා පාට කිරීම	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය්	58	11,700
44	දීපාවලි වෙළඳ පොළ	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය්	48	219,010
45	කාර්මික පුහුණුව- මහන මැෂින් අළුත් වැඩියා කිරීම	කරච්චි	20	8,700
46	කාර්මික පුහුණුව- අත් බෑග් මැසීම	කරච්චි	20	13,200
47	කාර්මික පුහුණුව- ඉටිපන්දම් සෑදීම	පූනකරි	20	16,450
48	තරුණ ව්‍යවසායකත්ව දිරිගැන්වීම	කරච්චි	30	8,200
49	ව්‍යාපාර නීති ක්‍රියාපටිපාටි	පච්චිලෙප්පල්ලි	30	4,700
50	නව ව්‍යාපාර අවස්ථාවන් හඳුනාගැනීම හා ක්‍රියාත්මක කිරීම	පූනකරි	30	6,200

51	කාර්මික පුහුණුව- සම්ප්‍රදායික ආහාර සකස් කිරීම	කන්ඩාවලෙයි	20	10,820
52	මිළ ඇස්තමේන්තුව	කරච්චි	20	9,200
53	අළෙවි ව්‍යාප්තිය	පූනකරි	10	6,000
54	අළෙවි ව්‍යාප්තිය	කන්ඩාවලෙයි	10	6,000
55	කාර්මික පුහුණුව- ආරි වර්ක්	පච්චිලෙප්පල්ලි	25	19,900
56	තරුණ ව්‍යවසායකත්ව දිරිගැන්වීම	කන්ඩාවලෙයි	20	3,200
57	පිරිවැය ගිණුම්කරණය	කරච්චි	20	9,200
58	ව්‍යවසායකත්වසංවර්ධන ප්‍රවර්ධන පාසල	පච්චිලෙප්පල්ලි	60	9,700
59	අළෙවිකරණ ව්‍යාප්තිය	කරච්චි	10	6,000
60	ව්‍යවසායකත්වසංවර්ධන ප්‍රවර්ධන පාසල	පූනකරි	60	9,900
61	සුළු ව්‍යාපාර කළමනාකරණය	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	30	11,200
62	කාර්මික පුහුණුව - ආභරණ නිෂ්පාදනය	කරච්චි	20	14,900
63	කාර්මික පුහුණුව - ආරි වර්ක්	පච්චිලෙප්පල්ලි	30	16,400
64	මිල ඇස්තමේන්තුව	කන්ඩාවලෙයි	20	4,700
65	පිරිවැය ගිණුම්කරණය	කන්ඩාවලෙයි	20	4,700
66	කාර්මික පුහුණුව - කිරි ආශ්‍රිත නිෂ්පාදන	පූනකරි	20	9,900
67	ව්‍යාපාර සැළසුම් සකස් කිරීම	කරච්චි	20	16,400
68	කාර්මික පුහුණුව - CCTVකැමරා අළුත්වැඩියා කිරීම	කන්ඩාවලෙයි	20	10,400
69	නිළධාරී සාකච්ඡා	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	14	2,250
70	ව්‍යාපාර උපදෙස් - ක්ෂේත්‍ර සංචාරය	පූනකරි	4	5,562
71	ව්‍යාපාර සැළසුම් සකස් කිරීම	පූනකරි	20	22,300
72	කාර්මික පුහුණුව - පාසල් ඇඳුම් සකස් කිරීම	කරච්චි	25	15,150
73	ව්‍යවසායකත්ව සංවර්ධන ප්‍රවර්ධන පාසල	කන්ඩාවලෙයි	60	11,100
74	කාර්මික පුහුණුව–තල් ආශ්‍රිත නිෂ්පාදන	පච්චිලෙප්පල්ලි	25	21,300
75	අත් දැකීම් බෙදාගැනීම - ක්ෂේත්‍ර සංචාරය	යාපනය	30	30,718
76	කාර්මික පුහුණුව - කේක් මල් සැරසිලි	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	25	28,900
77	වෙළඳ නීති රීති පද්ධතිය	කන්ඩාවලෙයි	20	4,400
78	වෙළඳ සැළසුම් සකස් කිරීම	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	22	19,300
79	කාර්මික පුහුණුව - මනමාලි සැරසිලි	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	30	20,400
80	ව්‍යවසායකත්ව සම්මේලනයක් පිහිටුවීම - මැහුම්	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	60	15,000

2.7 අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු

දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අභ්‍යන්තර පාලන හා ක්‍රමවේදයන්ද ඒ හා සම්බන්ධ කටයුතුවල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන අරමුණවේ.

අභ්‍යන්තර විගණන අංශය විසින් මෙම වසරේ ප්‍රවර්ධන වසර සඳහා වන වැඩ සටහන් අනුව මාසික පෙර වැඩ සටහන් පදනම් කරමින් විගණනය කරන ලදී. **2021** වන වසරේ සම්පූර්ණයෙන් විගණන විමසුම් දහ අටක් යවන ලදී. යවන ලද විගණන විමසුම් දහඅටකට පිළිතුරු ලැබුණු අතර සුදුසු කටයුතු සිදු කර ඇති බව සඳහන් කළ යුතුයි. තවද පසු ගිය වසර සමඟ සැසඳීමේදී මෙම වසර ඉතාමත් කාර්යක්ෂමතාවයෙන් යුතුව දක්නට තිබේ.

විෂය	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	ප්‍රාදේශීය ලේකම් කාර්යාල				එකතුව
		කරච්චි	කණ්ඩාවලෙ	පච්චිලෙප්පල්ලි	පුනකරි	
ඉදිරිපත් කරන ලද නිරීක්ෂණයන්	04	03	03	03	05	18
ඉදිරිපත් කරන ලද නිරීක්ෂණයන් සඳහා ලැබුනු ප්‍රතිචාර	04	03	03	03	05	18
සම්පූර්ණයෙන් පිළිතුරු නොලැබූ නිරීක්ෂණයන්	-	-	-	-	-	-

තවද නිරීක්ෂණ වාර්තා ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක අංශයටත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවටත් ජාතික විගණන කාර්යාලයටත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිවරයාටත් යවා තබනු ලැබුවේය.

වසරකට කළමනාකරන කමිටු රැස්වීම් සතරක් පවත්වන ලදී. පළමුවන රැස්වීම ගතවූ වසර වෙනුවෙන් හා අනෙක් රැස්වීම් තුනක්ම මෙම වසර සඳහා වේ . මෙම වසරේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලද විගණක කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වන ලදී.

මෙම වසර සඳහා වන රැස්වීම්වල පළමුවන, දෙවන හා සතර වන රැස්වීම්වලදී කළමනාකරණ විගණන දෙපරේතමේන්තුවේ අධ්‍යක්ෂක Online (Zoom) මඟින් ද තෙවන රැස්වීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පැමිණ සහභාගී වූ අතර ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක පළමුවන රැස්වීමේදී Online (Zoom) මඟින් ද සහභාගී වී ඇත.

කළමනාකරණ විගණක කමිටු රැස්වීම	පළමුවන කාර්තුව - 2022	දෙවන කාර්තුව - 2022	තෙවන කාර්තුව - 2022	සතරවන කාර්තුව - 2022
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කිලිනොච්චිය	22.03.2022	10.06.2022	14.09.2022	27.12.2022
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කරච්චි	18.02.2022	19.05.2022	12.08.2022	26.10.2022
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කණ්ඩාවලෙ	01.02.2022	04.05.2022	04.08.2022	28.10.2022
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - පච්චිලෙප්පල්ලි	15.02.2022	04.05.2022	10.08.2022	20.10.2022
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - පුනකරි	23.02.2022	29.04.2022	03.08.2022	21.10.2022

තවද ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අභ්‍යන්තර විගණක ශාඛා පිහිටුවා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ දැනුවත් කිරීම අනුව විගණන කටයුතු සාර්ථකව සිදු කර ගෙන යනු ලැබේ.

අභ්‍යන්තර විගණක නිලධාරීන් විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ක්‍රියා සැලසුම් නිරීක්ෂණය කර ඒවායේ කාර්යක්ෂමතාවය පිළිබඳ වාර්තා දිසාපතිතුමියට ඉදිරිපත් කරනු ලැබේ.

කළමනාකරණ විගණක කමිටු රැස්වීම්වලදී පහත සඳහන් කරුණු පිළිවෙල ශක්තිමත් කිරීමේ අරමුණෙන් හා අවදානම මඟ හැර ගැනීම සඳහාත් සාකච්ඡා කරන ලදී.

- ❖ අභ්‍යන්තර පාලනය හා අවදානම
- ❖ අභ්‍යන්තර විගණනය නිරීක්ෂණය හා විධිමත් කිරීම
- ❖ කේෂ්ත්‍ර සංචාර පිළිබඳ නිරීක්ෂණ
- ❖ ජාතික විගණන කාර්යාලයේ විගණන විමසුම් සම්ලෝචනය කිරීම.
- ❖ ගත වූ කාලයන්හි රජයේ ගිණුම් කාරක සභාව වාර්තා මත වූ ක්‍රියාකාරි ප්‍රගතිය

2.8 ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම්

මෙම දෙපාර්තමේන්තුවේ අරමුණ දිවයිනේ භූමි සම්පත විශිෂ්ට ලෙස පරිහරනය කිරීමට දිරිගැන්වීමයි. එකී අරමුණ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය නොයෙක් සේවාවන් දෙපාර්තමේන්තුව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක කරනු ලබයි.

නු අංකය	වැඩ සටහන	ස්ථානය	මූල්‍ය ප්‍රතිපාදන (රුපියල්)	වියදම (රුපියල්)	ළඟා කර ගත් ඉලක්ක
01	; ඉඩම් පරිහරණ දත්ත රැස්කිරීමයාවත්කාලීන , දත්ත හුවමාරු හා ,කිරීම සැලසුම	කරච්චි , කණ්ඩාවලෙ, පච්චිලෙප්පල්ලි, පුනකරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ	88,120	86,296	97.9%
02	සහභාගීත්ව ප්‍රවේශය මඟින් තිරසාර භූමි පරිහරණය සඳහා ග්‍රාමීය මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම	කණ්ඩාවලෙ, පච්චිලෙප්පල්ලි, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ	52,000	52,000	100%
03	ඉඩම් හිමිකම හා පරිහරණය කිරීම පිළිබඳ අධ්‍යයනය	කරච්චි , කණ්ඩාවලෙ, පච්චිලෙප්පල්ලි, පුනකරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ	21,260	20,230	95.15%
04	දිස්ත්‍රික් ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටු රැස්වීම	දිස්ත්‍රික්කය	13,500	12,430	92%
05	ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටු රැස්වීම	කරච්චි , කණ්ඩාවලෙ, පච්චිලෙප්පල්ලි, පුනකරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ	32,500	32,120	98.8%

2.9 කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම්

අපගේ දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම්

- පේෂකර්මාන්තනිෂ්පාදන හාපුහුණුව
- කොහු නිෂ්පාදන හාපුහුණුව
- සම්ප්‍රදායිකකුඩාකර්මාන්තපුහුණුව
- අනෙක් සම්ප්‍රදායික නොවන කර්මාන්තපුහුණුව

2022 වර්ෂයේ කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද තාක්ෂණික හුවමාරු පුහුණු පාඨමාලා විස්තර මෙසේ.

අංක	හුවමාරු පුහුණු පාඨමාලාව	ග්‍රාම සේවා වසම	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	කාලය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
01	සම්ප්‍රදායික සෞඛ්‍ය ආහාර සකස් කිරීමේ වට්ටෝරුව	කල්මඩු නගර්	කණ්ඩාවලෙ	දවස් 03 යි	15
02	Aari emprodery training	ක්‍රිෂ්ණපුරම්	කරච්චි	දවස් 07 යි	17

කෙටි කාලීන පුහුණු පාඨමාලා





ව්‍යවසායයන්ට අයත් සේවාවන් 2022

අනු අංක	විස්තර	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	වැය විස්තරය	කාලය
01	අපගේ පේෂ කර්මාන්ත මධ්‍යස්ථානයේ වීවිං මධ්‍යස්ථානයේ රැකී රක්ෂා ලබාදීම	**2**		**01.01.2022 – 31.12.2022**
02	අපගේ පේෂ කර්මාන්ත මධ්‍යස්ථානයේ වීවිං පුහුණුව ලබාදීම	**4**		**01.07.2022 – 31.12.2022**
03	අපගේ කොහු කර්මාන්ත මධ්‍යස්ථානයේ රැකී රක්ෂා ලබාදීම	**4**		**01.01.2022 – 31.12.2022**
04	අළුත් අවුරුද්ද නිමිත්තෙන් ව්‍යවසායකයින්ට විශේෂපොලක් සංවිධානය කිරීම (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුනක)	**123**	**56,750**	**07.04.2022 09.04.2022**
05	තෙ පොංගල් උත්සවය නිමිත්තෙන් විශේෂ වාණිජ පොලක් පළාත් මට්ටමෙන් යාපනයේ පවත්වන ලදී. (අපගේ දිස්ත්‍රික්කයෙන් විශිෂ්ඨ වයවසායකයින් 7 දෙනෙක් සහභාගීවූහ.)	**07**		**11,12.01.2022**

අළුත් අවුරුදු වෙළඳ පොළ - 2022





පළාත් මට්ටමේ වෙළඳ පොළ - 2022





කය ලබාදීම සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් **NAITA** ආයතනය මඟින් ලබාදීම

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් පවත් වන ලද දිනය	සහභාගී වූ ව්‍යවසායකයින්ගේ සංඛ්‍යාව	ඡායාරූප
කරච්චි	09.06.2022	20	

කන්ඩාවලෙයි	02.06.2022	14	
පූනකරි	03.06.2022	12	
පච්චිලෛප්පල්ලි	08.06.2022	4	

ඉහත ක්‍රියාකාරකම් මඟින් ව්‍යවසායකයින් 99 දෙනෙකුට NVQ සහතික ලබාදීම සඳහා වන අයැදුම් පත් NAITA ආයතනය වෙත ඉදිරිපත් කර සුදුසු කම් ලත් ව්‍යවසායකයින් 78 දෙනෙක් තෝරා ගෙන මේ සඳහා වන ගෙවීම් වශයෙන් NAITAහා TVEC ආයතනයන්ට රුපියල් 120,000 ක් ගෙවන ලදී.

ILO ආයතනය උතුරු පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව සමඟ එක්ව ක්‍රියාත්මක කරන LEED Project මඟින් කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ව්‍යවසායකයින් සතර දෙනෙක් තෝරා ඔහුන්ගේ ව්‍යවසායන් ව්‍යාප්ත කිරීමට එක් අයෙකුට රුපියල් 150,000 ක් වටිනා උපකරණ ලබාදී ඇත. .

- කර්මාන්ත පුහුණු මධ්‍යස්ථාන / අලෙවි මධ්‍යස්ථාන
- රෙදි විවීමේ මධ්‍යස්ථානය - ධරම්පුරම්, කන්ඩාවලෙයි
- කොහු කර්මාන්ත මධ්‍යස්ථානය - පුලෝප්පලෛ, පච්චිලෛප්පල්ලි
- ඇසුරුම් මධ්‍යස්ථානය - පල්ලික්කුඩා, පූනකරි
- දේශීය නිෂ්පාදන ද්‍රව්‍ය අලෙවි මධ්‍යස්ථානය - තිරුනගර්, කරච්චි

2.10 සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

01. සර්වාගමික වතාවන්

2022 වන වර්ෂය උදාවීම නිමිත්තෙන් ආශීර්වාද පතා ප්‍රාර්ථනාවන් පහත ආගමික ස්ථානවල සිදු කරන ලදී. **116** ත් වැඩි පිරිසක් සහභාගී වූහ.

1. ශුද්ධ වූ පාපරම්මා දේවස්ථානය, ඉත්තාවිල්, පච්චිලෛප්පල්ලි
2. කටපග විනායගර් කෝවිල, පිරමන්තනාරු, කන්ඩාවලෙයි
3. මුහයිදීන් ජුම්මා පල්ලිය, නාවච්ක්කුඩා
4. ලුම්බිණි විහාරය, කිලිනොච්චිය.






02. මහජන පුස්තකාලවලට පොත් ප්‍රදානය කිරීම

ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතරෙහිම පුස්තකාල දෙකක් බැගින් පුස්තකාල අටකට පොත් කාණ්ඩයක් පරිත්‍යාග කරන ලදී. **30** දෙනෙක් සහාභිගීවූහ.

1. කිලි / පරන්තන් ඉන්දු මහා විද්‍යාලය
2. මහජන පුස්තකාලය, මුරසුමෝට්ටෙයි
3. කිලි / සෝරන්පට්රු විග්නේස්වරා මහා විද්‍යාලය
4. කිලි / මාෂාර් ර.මී. පාසල
5. කිලි / තට්ටුවන්කොට්ටි කන්නගෙ මහා විද්‍යාලය
6. කිලි / තිරුවෙයාරු මහා විද්‍යාලය
7. කිලි / මුටිකොම්බන් මහා විද්‍යාලය
8. කිලි / අක්කරායන් මහා විද්‍යාලය
9. මහජන පුස්තකාලය, පූනරි
10. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කිලිනොච්චිය.






03. දිස්ත්‍රික් කලා හා සංස්කෘතික උත්සවය

කිලිනොච්චි දිස්ත්‍රික් කලා හා සංස්කෘතික උත්සවය පරන්තන්, රාසම්මා මනි මණ්ඩපයේ 2022.09.23 වන දින පවත්වනු ලැබුවේය. කලා වැඩ සටහන්, කලා කරුවන් ඇගයීම, ජාතික කලා හා සංස්කෘතික තරඟයේ ජයග්‍රහණය කළ අයවලුන් ඇගයීම ආදිය සිදු කරනු ලැබුවේය.300 දෙනෙක් පමණ සහභාගීවූහ.






04. දොලොස් මහේ පහන දැල්වීමේ වැඩ සටහන

.ආහාර හෝග වගාව දිරි ගැන්වීමේ අරමුණෙන් කලා සමාජයේ සිසුන්, ලමා සමාජ සාමාජිකයින් යන අයට එළවළු වගාව සඳහා පැළ ලබා දෙන ලදී.






නිම කරන ලද වැඩ සටහන්වල වැය විස්තරය - 2022

වැය ශීර්ෂය	වැඩසටහන	පවත්වන ලද ප්‍රදේශය	පවත්වන ලද දිනය	සහභාගීවූවන්ගේ සංඛ්‍යාව	පිරිවැය
206-02-03-1409	සර්වාගමික වැඩ සටහන	1.ශුද්ධ වූ පාපරම්මා දේවස්ථානය,ඉත්තාවිල්. 2 කටිපග විනායගර් කෝවිල, පිරමන්තනාරු 3.මුහයිදීන් ජුම්මා පල්ලිය,නාච්චික්කුඩා 4. ලුම්බිණි විහාරය,කිලිනොච්චිය.	07.01.2022 04.01.2022 11.01.2022 11.01.2022	22 54 30 10	10,000
206-02-02-	දිස්ත්‍රික් වැඩ	දිස්ත්‍රික් ලේකම්		36	6,000

2401	මුළුව	කාර්යාලය,කිලිනොච්චිය.			
206-02-02-02-1409	දිස්ත්‍රික් සංස්කෘතික උත්සවය	පරන්තන්, රාසම්මා මනි මණ්ඩපය, කිලිනොච්චිය.	**23.09.2022**	**300**	**60,000**
206-02-03-09-1409	දොලොස් මහේ පහනවැඩ සටහන	1. දිස්ත්‍රික් සංස්කෘතික සිතියම සකස් කිරීම 2. සිසුන්, ලමා සමාජ සාමාජිකයින් යන අයට එළවළු වගාව සඳහා පැළ ලබා දෙන ලදී. 3. 1.අම්බාල්කුලම් 2. වට්ටක්කච්චි	**25.09.2022** **12.12.2022**	**30** **60**	**5,750** **6,000**
එකතුව				**506**	**93,750**

වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වැඩ සටහන

වැය ශීර්ෂය	වැඩ සටහන	පවත්වන ලද ප්‍රදේශය	පවත්වන ලද දිනය	සහභාගීවූවන් සංඛ්‍යාව	පිරිවැය
101-02-09-018-2509	කලාකරුවන් දත්ත ජාලය පිහිටුවීම පිළිබඳ වූ අත් පත්‍රිකා මුද්‍රණය කිරීම	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	--	--	7,500
			--	--	**7,500**

2.11 සංගණන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුවේ කටයුතු

සංගණන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව වනාහි දිවයිනේ ජාතික සංඛ්‍යා ලේඛණ කාර්යාලය ලෙස පවතින අතර රජයට අවශ්‍ය සංඛ්‍යා ලේඛණ තොරතුරු එක් රැස් කිරීම, ප්‍රකාශ කිරීම ආදියට ප්‍රධාන භාරකරු ලෙස පවතින්නේය.

මෙම දිවයිනේ නොයෙක් ක්ෂේත්‍රයන්හි සමාජ ආර්ථික තත්ත්වය සම්බන්ධව සංඛ්‍යා ලේඛණ තොරතුරු එක් රැස් කිරීම, ප්‍රකාශ කිරීම ආදි එහි කාර්යභාරයට අතිරේකව සංඛ්‍යා ලේඛණ සංඥා ගණනය කිරීම ආදි සේවාවන් අවශ්‍ය වන සියළුම රජයේ නියෝජිතයන්ටත් වෘත්තීයමය නිළධාරීන් පුහුණු කර සේවයේ යෙදවීමද එහි මෙහෙවර වේ. එයත් සමඟ සංගණන හා සංඛ්‍යා ලේඛණ කරුණු සම්බන්ධයෙන් උපකාර අවශ්‍ය වන නියෝජිතයින්ට එහි තාක්ෂණික අංශය හරහා උපදෙස් සේවාවන්ද ලබාදෙයි.

දෙපාර්තමේන්තුවේ කටයුතු :-

- සාමාන්‍ය වී අස්වැන්න ඇගයීම සඳහා වසරේ කන්න දෙකෙහිම කරනු ලබන දළ මිමි
- කර්මාන්ත, වාණිජ, සේවාවන් පිළිබඳ වාර්ෂික ඇගයීම.
- ශ්‍රී ලංකා වෘත්තීය මිම්ම
- වී සංඛ්‍යා ලේඛණ
- ගොඩ ඉඩම් වගාව මහා කන්නය හා යල් කන්නය
- සිල්ලර මිල හා නිෂ්පාදන මිළ
- සත්ව සංඛ්‍යා ලේඛණ
- සාතන ස්ථානයේ මරනු ලබන සතුන්ගේ සංඛ්‍යාව
- ගොඩනැඟිලි සංඛ්‍යා ලේඛණ

කාර්යසාධන කටයුතු

2 වන පරිච්ඡේදය යටතට ගැනෙන සියළුම වැඩ සටහන්, **2021** වසරේ සාර්ථකව ඉටු කරන ලදී.

ලැබුණු මුල්‍ය ප්‍රතිපාදන	:-	රුපියල්. **739257.79**
වැය කල මුදල	:-	රුපියල්. **623725.11**
ඉතුරු මුදල	:-	රුපියල්. **115532.68**

2.12 සැලසුම් අංශයේ කටයුතු

1. විමධ්‍යගත අය වැය වැඩ සටහන්

2022 වර්ෂයේ විමධ්‍ය ගත අය වැය වැඩ සටහන් යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා පාර්ලිමේන්තු නියෝජිතයින් **08** දෙනා විසින් තෝරා ගන්නා ලද වැඩ සටහන් ඉදිරිපත් කරන ලදී. ප්‍රාදේශීය කොට්ඨාශ **04** ක අදාළ වැඩ සටහන් පිළිබඳ අධ්‍යයන කටයුතු සිදුවෙමින් පවතින කාලයේ **26.04.2022** දා මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේකයේ පටන් ගෙන නොමැති සියළුම අළුත් ව්‍යාපෘතීන්අත් හිට වන මෙන් දැනුවත් කිරීම මත ආර්ථික අර්බුදය හේතුවෙන් **2022** වර්ෂය සඳහා වන විමධ්‍ය ගත අය වැය යටතේ වූ සියළුම වැඩ සටහන් අත් හිට වන ලදී. විස්තර මෙසේ

කේෂ්ත්‍ර වශයෙන් වූ වැඩ සටහන්වල විස්තර. (විමධ්‍ය ගත අය වැය - 2022)

අනු අං	කේෂ්ත්රය	වැඩ සටහන් සංඛ්‍යාව	ප්‍රතිපාදන)රුපියල් මිලියන(
01	ජල සම්පාදනය	02	0.28
02	ග්‍රාමීය විදුලි සම්බන්ධතාවය	09	0.79
03	අධ්‍යාපන සංවර්ධනය	24	4.138
04	ග්‍රාමීය සෞඛ්‍ය සංවර්ධනය	1	0.100
05	මහජන ක්‍රීඩාංග හා පුස්තකාල සංවර්ධනය	17	3.399
06	සුළු වාරිමාර්ග	1	0.225
07	උපකරණ බෙදාදීම	48	4.336
08	ආර්ථික ප්‍රතිලාභ ගොඩනැඟිලි	2	0.38
එකතුව		**119**	**16.275**

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් වැඩ සටහන් විස්තර

අනු අං	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	වැඩ සටහන් සංඛ්‍යාව	ප්‍රතිපාදන (රුපියල් මිලියන)
01	කරච්චි	48	6.691
02	කන්ඩාවලෙයි	14	2.031
03	පූනකරි	42	6.563
04	පච්චිලෙප්පල්ලි	15	0.990
එකතුව		**119**	**16.275**

2. “ගම සමඟ පිළිසඳර”ග්‍රාම සංවර්ධන වැඩ සටහන මුදල් රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩ සටහන් මඟින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ **4** ට රූපියල් මිලියන **129** ක් වෙන් කර ඇත.

ව්‍යාපෘතියේ නම	සම්පූර්ණ ප්‍රතිපාදන	පිරිවැය
ග්‍රාම සංවර්ධන වැඩ සටහන	88,000,000	87,398,458.80
පළාත් පාලන සංවර්ධන වැඩ සටහන	24,500,000	24,495,824.48
ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන	16,500,000	16,149,688.25
එකතුව	**129,000,000**	**128,043,971.53**

කේෂ්ත්‍ර වශයෙන් වූ ප්‍රතිපාදන විස්තර

අනු අං	කේෂ්ත්‍රය	වැඩ සටහන් සංඛ්‍යාව	ප්‍රතිපාදන (රුපියල් මිලියන)
01	ග්‍රාම සංවර්ධන වැඩ සටහන	57	46.8
02	පළාත් පාලන සංවර්ධන වැඩ සටහන	120	67.6
03	ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන	10	3
04	ග්‍රාම සංවර්ධන වැඩ සටහන	38	11.6
එකතුව		**225**	**129**

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් ප්‍රතිපාදන විස්තර

අනු අං	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	වැඩ සටහන් සංඛ්‍යාව	ප්‍රතිපාදන (රුපියල් මිලියන)
01	කරච්චි	100	61
02	කන්ඩාවලෙයි	46	26
03	පූනකරි	61	31
04	පච්චිලෙප්පල්ලි	18	11
එකතුව		**225**	**129**

2.13 ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය

ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය දිස්ත්‍රික්කයේ ආපදා අවදානම කළමනාකරණ කටයුතුවලට පහසු වන සේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සමඟ සම්බන්ධ කර ක්‍රියාත්මකවේ. එහි ප්‍රධාන කටයුතු ලෙස,

1. ආපදාවන්හි අනාගත හානි අවම කර ගැනීම සඳහා ප්‍රජාවන් හා හවුල්කරුවන් සූදානම් කර දිස්ත්‍රික්කයේ යථා තත්වය අවම කිරීම, වැළක්වීම හා සූදානම් වීම වැනි ආපදා අවම කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට උපකාරී වීම.
2. දිස්ත්‍රික්කයේ තිරසාර සංවර්ධනය තහවුරු කිරීම සඳහා සංවර්ධන කේෂ්ත්‍රයේ ආපදා අවම කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට දිරි ගැන්වීම.
3. හදිසි තත්වයන්ට ප්‍රතිචාර දැක්වීමට වහාම හා අවශ්‍ය පියවර ගනු ලබන අතර දිස්ත්‍රික් මට්ටමේ ප්‍රතිචාර හා මුදවා ගැනීමේ කටයුතු වේගවත් කිරීමට සියළුම පාර්ශවයන් සම්බන්ධීකරණය කිරීම.

ආපදා අවම කිරීම සඳහා ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය 2022 හි පහත කටයුතු සිදුකරනු ලැබුවේ ය.

1. පුහුණුව හා දැනුවත් කිරීමේ කටයුතු

වැඩ සටහන	වැඩ සටහන් සංඛ්‍යාව	ප්‍රතිපාදන (රුපියල් මිලියන)	වියදම (රුපියල්)	ඉතුරු (රුපියල්)
පුහුණුව හා දැනුවත් කිරීම	07	120,000	117,110	2,890



පළාත් පාලන නිලධාරීන් සඳහා වන ආපදා අවදානම් කළමනාකරණ වැඩමුළු



විදුහල්පතීන් සඳහා වූ ආපදා අවදානම් කළමනාකරණ වැඩමුළු



ජාතික ආරක්ෂක දිනය 2022

2. පෙර සූදානම් හා සැලසුම් කටයුතු

වැඩ සටහන	වැඩ සටහන් සංඛ්‍යාව	ප්‍රතිපාදන (රුපියල් මිලියන)	වියදම (රුපියල්)	ඉතුරු (රුපියල්)
පෙර සූදානම් හා සැලසුම් කටයුතු	08	138,800	136,320	2,480







ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ ඊසාන මෝසම් වැසි පෙර සූදානම් රැස්වීම	පළාත් පාලන මට්ටමේ ආපදා කළමනාකරණ සැලසුම් සම්බන්ධයෙන් දිස්ත්‍රික් මට්ටමේ රැස්වීම	ග්‍රාමීය මට්ටමේ ආපදා කළමනාකරණ සැලසුම් සකස් කිරීම.

3. හදිසි ප්‍රතිචාර කටයුතු ක්‍රියාකාරකම්

- ඊසාන මෝසම් වැසි ප්‍රතිචාර කටයුතු
- මොන්ටස් කුණාටුවේ දී ප්‍රතිචාර කටයුතු








2.14 සමාජ සේවා දෙපාර්තමේන්තුව

කාන්තා ලමා කටයුතු හා සමාජ බලගැන්වීමේ අමාත්‍යාංශය යටතේ සමාජ සේවා දෙපාර්තමේන්තුව, ආබාධිත පුද්ගලයින් සඳහා වන ජාතික ලේකම් කාර්යාලය, වැඩිහිටි මහ ලේකම් කාර්යාලය සඳහා වූ 2022 වන වර්ෂය සඳහා වන වැඩ සටහන්.

1. ආබාධිත පුද්ගලයින් සඳහා වන රුපියල් 5000/- දීමනාව ආබාධිත පුද්ගලයින් ගේ ජීවනෝපාය ප්‍රවර්ධනය කිරීම සඳහා රුපියල් 5000/- දීමනාව ගෙවනු ලැබේ.

අංක	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ	දීමනා ලබන අයවලුන්	බලාපොරොත්තු ලැයිස්තුවේ සිටින අයවලුන්
1	කරච්චි	548	533
2	කන්ඩාවලෙයි	301	326
3	පූනකරි	304	152
4	පච්චිලෙප්පල්ලි	253	215
එකතුව		**1406**	**1226**

2. අවුරුදු 70 ට වැඩි වැඩිහිටියන් සඳහා රුපියල් 2000 දීමනාව ගෙවනු ලැබේ.

අංක	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	දීමනා ලබන අයවලුන්	බලාපොරොත්තු ලැයිස්තුවේ සිටින අයවලුන්
1	කරච්චි	2013	769
2	කන්ඩාවලෙයි	732	301
3	පූනකරි	609	220
4	පච්චිලෙප්පල්ලි	379	200
එකතුව		**3823**	**1490**

3. අවම පහසුකම් හා සෞඛ්‍ය ද්‍රව්‍ය ලබාදීම.

අංක	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	මුදල (රුපියල්)
1	කරච්චි	450,000
2	කන්ඩාවලෙයි	336,000
3	පූනකරි	450,000
3	පච්චිලෙප්පල්ලි	450,000
එකතුව		**1,686,000**

4. ග්‍රාමීය වැඩිහිටි සංගම් දිරි ගැන්වීම

අංක	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	මුදල (රුපියල්)
1	කරච්චි	99,880
2	පූනකරි	100,000
එකතුව		**199,880**

5. ආරෝග්‍යා වැඩිහිටියන් සඳහා මූල්‍ය ආධාර ලබාදීම

අංක	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	මුදල (රුපියල්)
1	කන්ඩාවලෙයි	100,000
එකතුව		**100,000**

6. අධ්‍යාත්මික සංචාරය

අංක	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	මුදල (රුපියල්)
1	කරච්චි	50,000
එකතුව		**50,000**

2.15 කෘෂි සංවර්ධන සැලසුම් ක්‍රියාකාරකම්

<table>
<tr><th>අනු. අංක</th><th>ව්‍යාපෘතිය</th><th colspan="5">ප්‍රගතිය</th></tr>
<tr><td rowspan="14">1</td><td rowspan="14">වගා නිෂ්පාදන ක්‍රියා සැලසුම I -2022
වගා නිෂ්පාදන ක්‍රියා සැලසුම යටතේ මිලියන 2 ක ග්‍රාමීය ආර්ථික වගාව හා ප්‍රවර්ධන අංශය විසින් වෙන් කරන ලදී. මෙම සැලසුම වනාහි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ප්‍රතිලාභීන්ට උඳු හා මුං බෙදා හරින ලදී.</td><td colspan="5">බීජ බෙදා හැරීම
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් බීජ ලබා ගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයද ඇතුළත් කර ගෙන මුං උඳු බීජ බෙදා හරින ලදී.එහි විස්තර මෙසේ.</td></tr>
<tr><td>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය</td><td>බෝග වර්ග</td><td>බෙදා හරින ලද බීජ ප්‍රමාණය (Kg)</td><td>වගා කරන ප්‍රමාණය (අක්කර)</td><td>ප්‍රතිලාභීන් සංඛ්‍යාව</td></tr>
<tr><td rowspan="2">කරච්චි</td><td>උඳු</td><td>720</td><td>72</td><td>172</td></tr>
<tr><td>මුං</td><td>385</td><td>38.5</td><td>79</td></tr>
<tr><td rowspan="2">කන්ඩාවලෙයි</td><td>උඳු</td><td>320</td><td>32</td><td>67</td></tr>
<tr><td>මුං</td><td>160</td><td>16</td><td>32</td></tr>
<tr><td rowspan="2">පූනකරි</td><td>උඳු</td><td>172.5</td><td>17.25</td><td>27</td></tr>
<tr><td>මුං</td><td>67.5</td><td>6.75</td><td>11</td></tr>
<tr><td rowspan="2">පච්චිලෙප්පල්ලි</td><td>උඳු</td><td>242.5</td><td>24.25</td><td>43</td></tr>
<tr><td>මුං</td><td>125</td><td>12.5</td><td>20</td></tr>
</table>

<table>
<tr><th>අනු. අං.</th><th>ව්‍යාපෘතිය</th><th colspan="5">ප්‍රගති තත්වය</th></tr>
<tr><td>2</td><td>වගා නිෂ්පාදන ක්‍රියා සැලසුම II -2022
වගා නිෂ්පාදන ක්‍රියාසැලසුමI -2022
වගා නිෂ්පාදන ක්‍රියා සැලසුම යටතේ මිලියන 2 ක ග්‍රාමීය ආර්ථික වගාව හා ප්‍රවර්ධන අංශය විසින්වෙන් කරන ලදී. මෙම සැලසුම වනාහි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ප්‍රතිලාභීන්ට උඳු හා මුං බෙදා හරිනලදී වගා නිෂ්පාදන ක්‍රියා සැලසුම I - 2022
වගා නිෂ්පාදන ක්‍රියා සැලසුම යටතේ මිලියන 2 ක ග්‍රාමීය ආර්ථික වගාව හා ප්‍රවර්ධන අංශය විසින් වෙන්කරනලදී. මෙම සැලසුම වනාහි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ප්‍රතිලාභීන්ට උඳු හා මුං බෙදාහරිනලදී</td><td colspan="5">බීජබෙදාහැරීම
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් බීජ ලබාගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයද ඇතුළත් කරගෙන මුං උඳු බීජ බෙදාහරිනලදී.එ හිවිස්තරමෙසේ.
<table>
<tr><th>ප්‍රාදේශීයලේකම් කොට්ඨාශය</th><th>බෝගවර්ග</th><th>බෙදාහරින ලදබීජප්‍රමාණය (Kg</th><th>වගාකරනප්‍රමාණය (අක්කර)</th><th>ප්‍රතිලාභීන් සංඛ්‍යාව</th></tr>
<tr><td rowspan="2">කරච්චි</td><td>උඳු</td><td>2330</td><td>233</td><td>523</td></tr>
<tr><td>මුං</td><td>450</td><td>45</td><td>180</td></tr>
<tr><td rowspan="2">කන්ඩාවලෙයි</td><td>උඳු</td><td>1182.5</td><td>11825</td><td>247</td></tr>
<tr><td>මුං</td><td>275</td><td>27.25</td><td>109</td></tr>
<tr><td rowspan="2">පච්චිලෙප්පල්ලි</td><td>උඳු</td><td>950</td><td>95</td><td>163</td></tr>
<tr><td>මුං</td><td>125</td><td>12.5</td><td>50</td></tr>
<tr><td rowspan="2">පූනකරි</td><td>උඳු</td><td>537.5</td><td>53.75</td><td>80</td></tr>
<tr><td>මුං</td><td>295</td><td>29.5</td><td>37</td></tr>
</table></td></tr>
</table>

2.16 මෝටර් රථවාහන දෙපාර්තමේන්තුවේ කටයුතු

කිළිනොච්චි මෝටර් රථවාහන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ශාඛාව විසින් පොදු ජනතාවට අවශ්‍ය රියදුරු බලපත්‍ර ලබා දීම , ඔවුන්ගේ වාහන අංක තහඩු ලබා දීම ඔවුන්ගේ වාහන අවශ්‍ය පරිදි පරීක්ෂා කර පරීක්ෂණ සහතික ලබාදීම ආදී සේවාවන් ඉටු කරයි.මෙලෙස පසුගිය **2022** වර්ෂයේ පොදු ජනතාව වෙනුවෙන් ලබා දෙන ලද සේවාවන් මෙසේය.

1.අළුතෙන් රියදුරු බලපත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත් 2699 ක්ද, මීට පෙර රියදුරු බලපත්‍ර ලබා ගත් අයගේ සැහැල්ලු වාහන දිගුව සඳහා ඉදිරිපත් කළ අයදුම්පත් 361ක්ද , බරවාහන දිගුව සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් 247 ක්ද , වශයෙන් සම්පූර්ණ රියදුරු අයදුම්පත් 6458 ක් ලබා ගන්නා ලදී.

2. මෙලෙස අයැදුම් කළ නව අයදුම්කරුවන් 2699 දෙනෙකුටද , බර වාහන රියදුරු බලපත්‍ර දිගුවට අයදුම්කළ 247දෙනෙකුටද , නැවත පරීක්ෂණය අයදුම් කළ1238දෙනෙකුටද ලිඛිත පරීක්ෂණ පවත්වන ලදීග ඔවුන් අතරෙන් සමත් වූ 2876 දෙනෙකුට පුහුණු බලපත්‍ර ලබා දෙන ලදී.

3. ලිඛිත පරීක්ෂණයෙන් සමත් වී පුහුණු බලපත්‍ර ලබා ගත් 2876 දෙනෙකුටත්, සැහැල්ලු වාහන රියදුරු බලපත්‍ර දිගුවට අයැදුම් කල 361 දෙනෙකුටත් ප්‍රායෝගික පරීක්ෂණ පවත්වා තාවකාලික රියදුරු බලපත්‍ර ලබා දෙන ලදී.

4. එයත් සමඟ ප්‍රධාන කාර්යාලයෙන් ලැබුණු වාහන 356 ක් සඳහා අංක තහඩු හිමිකරුවන්හට ලබා දෙන ලදී.

5. රථවාහනවල චැසිය වෙනස් කිරීම සඳහා අයැදුම් කළ 27 දෙනෙකුගේ වාහන පරීක්ෂා කර වාහන බර සහතික නිකුත් කරන ලදී. එයත් සමඟ නොයෙක් අවශ්‍යතාවයන් සඳහා වාහන පරීක්ෂා කර වාහන පරීක්ෂණ වාර්තා 79 ක්ද නිකුත් කරන ලදී.

6. ප්‍රධාන කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද IVR ක්‍රමය මඟින් සේවා රාශියක් දිගු රැඳීමක් නොමැතිව ප්‍රතිලාභීන්ට ලබාදෙමින් පවති.

7. මෙම කාර්යාලය විසින් ඉටුකරනලද ඉහත සේවාවන් මඟින් රුපියල් 17,122,875 සේවා ගාස්තු අය කර ගනු ලැබුවේය.

2.17 දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කටයුතු පිළිබඳ විස්තර

I ලේඛණ ලියාපදිංචි කිරීම

I. ලියාපදිංචි කරන ලද ඔප්පු	
a. ඉක්මන් සේවාව	224
b. සාමාන්‍ය සේවාවන්	1733
II. ලියාපදිංචි කරන ලද රාජ්‍ය දීමනා පත්‍ර	1094
III. ලබාගත් අනු පිටපත්	1256
IV. ලබාගත් අනු පිටපත්	
a. ඉක්මන් සේවා	217
b. සාමාන්‍ය සේවාවන්	63
V. ලබා දෙන ලද සාරාංශ පිටපත්	
a. ඉක්මන් සේවාව	1959
b. සාමාන්‍ය සේවාවන්	68
VI. ලබා දෙන ලද අනුමාන වයස් සහතික	-
VII. ලබාගන්නා ලද සොයාගැනීමේ අයදුම්පත්	08
VIII. අනුමත කරන ලද කල්ගතවූ උපත්	-
IX. භාෂා පරිවර්තන අයදුම්පත් සංඛ්‍යාව	-
X. ලබා ගන්නා ලද උපත් මරණ හා විවාහ අයදුම්පත්	4097
XI. ලියා පදිංචි කරන ලද	
a. උපත්	07
b. මරණ	04
c. විවාහ	03

2 ගෙවීම් පිළිබඳ විස්තර (ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය)

ඔප්පුලියාපදිංචිකිරීම

a. ඉක්මන්සේවාව	221500
b. සාමාන්‍යසේවාවන්	190200

ඔප්පු පිටපත් / සාරාංශ පිටපත්

	a. ඉක්මන් සේවාව	608800
	b. සාමාන්‍ය සේවාවන්	51360
I.	සොයාගැනීම්	4800
II.	අනුපිටපත්වල අලවා ඇති මුද්දරවල වටිනාකම	35099205.55
III.	භාෂා පරිවර්තන ගාස්තු	-
IV.	ලබාගන්නා ලද උපත් මරණ හා විවාහඅයදුම්පත්	613440
V.	ලියාපදිංචි කරන ලද විවාහ හා විවාහ දැන්වීම්	4200

3. ප්‍රාදේශීය කාර්යාලයේ කටයුතු පිළිබඳ විස්තර

I.	ලබාගන්නා ලද උපත් , මරණ හා විවාහ අයදුම්පත්	41004
II.	ලබාදෙන ලද පිටපත්	56647
III.	ලියාපදිංචි කරන ලද	
	a. උපත්	2774
	b. මරණ	785
	c. විවාහ	1152
IV.	අනුමත කරන ලද සංශෝධන (27,27(a),52(1)	405
V.	අනුමත කරන ලද කල්ගත වූ උපත්(24)	761
VI.	අනුමත කරන ලද කල්ගත වූ මරණ(36)	37

2. ගෙවීම් පිළිබඳ විස්තර (ප්‍රාදේශීය ලේකම් කාර්යාල)

(කරච්චි , කණ්ඩාවලෙ , පච්චිලෙප්පල්ලි , පුනකරි)

I.	ලබාගන්නා ලද උපත් මරණ හා විවාහ අයදුම්පත් සඳහා වන ගාස්තු	7133080
II.	ලබාගන්නා ලද කල් ගතවූ උපත් මරණ සංශෝධන සඳහා වන ගාස්තු	74220
III.	විවාහ ලියාපදිංචි ගාස්තු	119860

2.18 සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු

01. සහනාධාර දීමනා ගෙවීම් පිළිබඳ විස්තර (ප්‍රාදේශීයලේකම්කාර්යාල) සතරකට පහත අයුරෙන් ලබා දෙන ලදී.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල	කළාපය	සහනාධාර ලබන සමෘද්ධිපවුල්	සහනාධාර ලබන පවුල් සංඛ්‍යාව මත සහනාධාර දීමනා රුපියල්			
			මුද්දරරු. 420/=	මුද්දරරු. 1900/=	මුද්දරරු. 3200/=	මුද්දරරු. 4500/=
කරච්චි	කිලිනගර්	2215	4	782	387	1037
	වට්ටක්කච්චි	2285	10	838	362	1072
	ස්කන්දපුරම්	3610	12	1219	592	1768
	මලයාලපුරම්	3810	1	1185	695	1922
කණ්ඩාවලෙ	කණ්ඩාවලෙ	4935	2	1685	888	2360
පුනකරි	පුනකරි	1532	0	491	269	772
	ජෙයපුරම්	2260	0	720	327	1213
පච්චිලෙප්පල්ලි	පලෙයි	1861	21	639	324	877
එකතුව		**22508**	**50**	**7559**	**3844**	**11021**

02. සමෘද්ධි සමාජ ආරක්ෂණ දීමනාව ලෙස (උපත්, මරණ, විවාහ, රෝහල් දීමනා,සිප්දොර ශිෂ්‍යත්ව ත්‍යාග) ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතරකට ප්‍රතිලාභීන් 36732 ට රුපියල් මිලියන 6.6 ක් ලබාදී ඇත.

03. කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන වැඩසටහන සඳහා රුපියල් 44,425.00 වියදමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සතරෙහි ප්‍රතිලාභීන් 95 දෙනෙකුට පුහුණුව ලබා දෙන ලදී.

04. නිවාස ලොතරැයි ඇදීම මඟින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට මාසිකව එක් ප්‍රතිලාභියෙකුට රුපියල් ලක්ෂ දෙකක් බැගින් ප්‍රතිලාභීන් 48 දෙනෙකුටමිලියන 9.6 ක් ලබාදෙන ලදී.

05. ප්‍රතිසංස්කරණ හා නව නිවෙස් ඉදිකිරීම් වැඩසටහන මඟින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සතරකට අයත් ප්‍රතිලාභීන් 24 දෙනෙකුට රුපියල් 5,525,000.00 ලබාදීඇත.

06. සමාජ සංවර්ධන වැඩසටහන මඟින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සතරකට අයත් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටීමට නියමිත සිසුන් හට වැඩමුළු පැවත්වීමට රුපියල් 100000.00 වැයකරන ලදී.

07. විශේෂ අලෙවි සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සතරකට අයත් ව්‍යවසායකයින් 218 දෙනෙකුට රුපියල් 96.000.00 වියදමින් පුහුණු පන්ති පවත්වා ඇත.

08. ගෙවතුවගාසංවර්ධනයවැඩසටහනමඟින්ප්‍රාදේශීයලේකම්කොට්ඨාශසතරකටඅයත්පවුල් 20074 ටරුපියල්මිලියන 3.6 ක්වටිනාබීජපැකට්හාපැළලබාදීඇත.

2.19 ඵලදායිතාප්‍රවර්ධනඒකකයේකටයුත

ඵලදායිතා ප්‍රවර්ධන, කාර්මික අධ්‍යාපනය, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පහත වැඩසටහන් සිදුකරන ලදී.

- තෘතයික අධ්‍යාපනය සංවර්ධනය පිලිබඳ දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීම - 01
- තෘතයික අධ්‍යාපනය සංවර්ධනය පිලිබඳ දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීම - 02
- රැකියා මහපෙන්වීම් වැඩසටහන් - 05
- රැකියා ආරම්භ කිරීම පිළිබඳ පුහුණු - 01

2.20 විදේශරැකියාදෙපාර්තමේන්තුව

විදේශ රැකියා දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂයේ පහත වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

1. ලිංගික සමානාත්මකභාවය
2. ඵලදායිතා ප්‍රවර්ධන - 08
3. ළමාරක්ෂණ - 02
4. වෙනත් - 14
5. ආරක්ෂිත විදේශ ගතවීම - 03
6. මත්ද්‍රව්‍ය මර්ධනය කිරීම පිළිබඳ දැනුවත් කිරීම් - 03

2.21 විදාතා අංශය

කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන විදාතා අංශය විසින් පහත වැඩ සටහන් පවත්වන ලදී.

1. තාක්ෂණය හා සබැඳි පුහුණු පාඨමාලාව - **05**
2. කාර්මික උපදෙස් - **12**
3. තත්ව සහතික කිරීම සඳහා වන අයැදුම්පත් ලබාදීම - **06**
4. කලින් බිහිකරන ලද ව්‍යවසායකයින්ව දිගටම නිරීක්ෂණය කිරීම - **120**
5. අපනයනකරුවන් සඳහා වන ජාලයක් නිර්මාණය කරන ලදී.

03. දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මුල්‍ය කාර්ය සාධනය

3.1 මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

එස්ඒඒ-එෆ්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහ	තත්‍ය 2022 රු.	නැවත ගලපන 2021 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එස්ඒඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		855,075,000	1,491,480,000	එස්ඒඒ-3
-	තැන්පතු		167,361,596	114,358,593	එස්ඒඒ-4
-	අත්තිකාරම් ගිණුම්		15,759,587	16,560,762	එස්ඒඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-		
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		1,038,196,182	1,622,399,355	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		1,038,196,182	1,622,399,355	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	48,000,000	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		1,038,196,182	1,574,399,355	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
288,200,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රති	5	276,057,988	208,933,039	
69,590,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	60,631,075	52,643,799	එස්ඒඒ-2(ii)
1,210,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	1,209,328	61,620,648	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
359,000,000	**මුළු පුනරාවර්තන වියදම් (ඒ)**		337,898,392	323,197,486	
	මූලධන වියදම්				
11,100,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	7,068,841	9,152,013	
8,700,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	8,219,674	17,466,739	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	එස්ඒඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
1,200,000	හැකියා වර්ධනය	14	1,169,252	1,425,884	
129,000,000	වෙනත් මූලධන වියදම්	15	128,995,341	-	
150,000,000	**මුළු මූලධන වියදම් (උ)**		145,453,108	28,044,636	
